# විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය

## ප්‍රසම්පාදන දැන්වීම

### මාසික කුලී පදනම මත රියදුරු හා ඉන්ධන රහිතව ආසන 08 වෑන් රථයක් ලබා ගැනීම

1. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය සඳහා එක් වසරක කාලයකට පහත සඳහන් තත්ත්වයන්ගෙන් යුත් ආසන අටේ (08) වෑන් රථයක් මාසික කුලී පදනම යටතේ ලබා ගැනීම සඳහා පිළිගත් ආයතන හා පුද්ගලික හිමිකරුවන් වෙතින් මුද්‍රා තැබූ මිල ගණන් කැඳවනු ලැබේ.
   - ★ සපයන ඩීසල් / හයිබ්‍රිඩ් වෑන් රථ 2010 වර්ෂයේ හෝ ඊට පසුව නිෂ්පාදනය කරන ලද්දක් විය යුතුය.
   - ★ වාහනයේ ඇතුලත හා පිටත මනා තත්ත්වයේ පැවතිය යුතුය.
   - ★ ද්විත්ව වායුසමීකරණ පද්ධතිය ඉතා හොඳ තත්ත්වයේ තිබිය යුතුය.
   - ★ වාහනයේ එන්ජිම, ටයර්, තිරිංග පද්ධතිය, ගියර් පද්ධතිය ඉතා හොඳ තත්ත්වයේ තිබිය යුතුය.
   - ★ වාහනය සඳහා පූර්ණ රක්ෂණාවරණයක් තිබීම අවශ්‍ය වේ.(ගමන් ගන්නා මගීන් ඇතුලුව කුලී ධාවනය සඳහා)
2. ජාතික තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාවලිය අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුවේ.
3. සුදුසුකම් ලත් හා උනන්දුවක් දක්වන සැපයුම්කරුවන් සඳහා 2018.07.26 දින සිට 2018.08.09 දින දක්වා රාජකාරී දිනවලදී පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා මිල කැඳවුම් ලේඛන පරීක්ෂා කර බලා පහත සඳහන් ලිපිනයෙන් මිලදී ගත හැකිය. වැඩි විස්තර අධ්‍යක්ෂ (පරිපාලන) වෙතින් විමසිය හැකිය.
4. මේ පිළිබඳ උනන්දුවක් දක්වන ලංසුකරුවන් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර රු.1,000/= (VAT සමඟ) ආපසු නොගෙවන තැන්පතු මුදලක් ගෙවා ලංසු පත්‍රිකා මිල දී ගත හැකි අතර, 2018.08.09 දින පස්වරු 2.00 දක්වා ලංසු පත්‍රිකා නිකුත් කරනු ලැබේ.
5. ලංසුව, වෙන වෙන ම "මුල් පිටපත" හා "අනු පිටපත" ලෙස සඳහන් කර, 201808.09 දින පස්වරු 2.00 ට හෝ ඊට පෙර කාමර අංක F 04හි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට, ගෙනැවිත් භාරදීමට හෝ නියමිත වේලාවට ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට හැකි වන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නියමිත වේලාවට පසු ලැබෙන ලංසු පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු විවෘත කිරීම, ලංසුකරු හෝ ඔහුගේ නියෝජිතයන් ඉදිරියේ, ලංසු භාර ගැනීම අවසන් වූ වහාම සිදුකරනු ලැබේ.
   ලංසුපත් සමඟ, ලංසු බැඳුම්කරය අමුණා එවිය යුතුය.
6. ලංසු ඉදිරිපත් කරන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"මාසික කුලී පදනම මත වාහන සැපයීම"** යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.
7. ලංසු පත් භාර ගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය සතු වේ.


සභාපති

දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව

**ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය**

60/460, බේස්ලයින් පාර, ඔරුගොඩවත්ත

වැල්ලම්පිටිය.

දුරකථන : 0112 533427

ෆැක්ස් : 0112 533448